සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

07 ශ්‍රේණිය — වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 — 11 S

**බුද්ධ ධර්මය** — කාලය පැය දෙකයි

නම / විභාග අංකය

සැලකිය යුතුයි : ★ පළමු කොටසේ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I - කොටස

01) සත් සතිය ගත කිරීමේදී බුද්ධ ශරීරයෙන් බුදුරුස් විහිදෙන්නට පටත් ගත් සතිය වනුයේ ,
i) පළමු සතිය. ii) තෙවන සතිය. iii) සිව්වන සතිය. iv) පස්වන සතිය.

02) බුදු සසුනේ ද්වෛවාචික උපාසකයන් වූයේ ,
i) අනේපිඩු සිටුතුමා. ii) තපස්සු භල්ලුක. iii) බිම්බිසාර මහරජු iv) කොසොල් රජු

03) බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළේ,
i) සහම්පති මහා බ්‍රහ්මයා. ii) සොත්ථිය බමුණා.
iii) සංජය පරිබ්‍රාජකයා. iv) කොණ්ඩඤ්ඤ තවුසා.

04) පස්වග මහණුන් රහත් වූයේ , කුමන සූත්‍රය ඇසීමෙන්ද?
i) දම්සක් පැවතුම් සූත්‍රය. ii) පරාභව සූත්‍රය.
iii) අනත්ත ලක්ඛණ සූත්‍රය. iv) මහා මංගල සූත්‍රය.

05) යසකුල පුත්‍රයාගේ හොඳම මිතුරෙකි ,
i) ගවම්පති. ii) සුනීත. iii) භද්දිය. iv) උපක.

★ අංක 06 සිට 10 දක්වා ප්‍රකාශවලට අදාළ පිළිතුර හරි නම් ( ✓ ) සළකුණ ද වැරදි නම් ( X ) සළකුණ ද යොදන්න.

06) බුදු සසුනේ ප්‍රථම සංඝ සන්නිපාතය සඳහා සහභාගි වූ භික්ෂු ශ්‍රාවකයෝ අතර සැරියුත් මුගලන් දෙනමද ඇතුළත් විය (...........).

07) බුදු සසුනේ ප්‍රථමයෙන් සෝවාන් වූ රජු කොසොල් රජුය (...........).

08) සෝපාක යනු බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයෙකි (...........).

09) ගිලනුන්ට උපස්ථාන කිරීම මහත් අකුසල ක්‍රියාවකි (...........).

10) යහපත් ගමන් ඇති හෙයින් බුදුරජාණන් වහන්සේ සුගත නම් වන සේක (...........).

★ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

11) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 15 ක් ඇතුළත් වන්නේ ........................................ සූත්‍රයේය.

12) බුදුරජාණන් වහන්සේ හා සුදත්ත සිටුවරයා මුලින්ම ........................................ දී හමුවිය.

13) බුදු දහම උඩුගං බලා යාමට මඟ පෙන්වන හෙවත් ........................................ දහමකි.

14) ගිහියාගේ නිත්‍ය සීලය ........................................ නම් වේ.

15) ගුරුවරයාගෙන් ශිෂ්‍යයා වෙත ලබාදෙන යුතුකමක් ලෙස ........................................ දැක්විය හැකිය.

( පංචශීලය , අෂ්ඨාංග ශීලය , පටිසෝතගාමි , සීත වනයේ , අනුසෝතගාමි , මහා මංගල සූත්‍රය , යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම, කරණීය මෙත්ත සූත්‍රය )

⋆ අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා 'A' කොටසට ගැළපෙන පිළිතුර 'B' කොටසින් තෝරා යා කරන්න.

| | | | |
|---|---|---|---|
| 16) | නිවැරදි නායකත්වය | i | මංගල කරුණක් |
| 17) | දස පුණ්‍ය ක්‍රියා | ii | ධම්ම නියාමය |
| 18) | " සිංහලයා ඉතා විනීතය " | iii | අපණ්ණක ජාතකය |
| 19) | ඉවසීම | iv | වෘද්ධාපචායනය |
| 20) | දරුවකු තරුණයකු වීම | v | රොබට් නොක්ස් |

## II කොටස

**පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

01) කෙටි පිළිතුරු සපයන්න.
1. අප වැඩිහිටියන්ට සැළකිය යුත්තේ කුමක් නිසාද? (ල. 2)
2. සිංහල ජාතියට නායකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේලා දෙනමක් නම් කරන්න. (ල. 2)
3. නියාම ධර්ම දෙකක් නම් කරන්න. (ල. 2)
4. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් රෝග හට ගැනීමේ ක්‍රම දෙකක් දක්වන්න. (ල. 2)
5. අධිපති ධර්මයෙන්ගෙන් දෙකක් නම් කරන්න. (ල. 2)
6. අප කථාකරන වචනවල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග 02 ක් නම් කරන්න. (ල. 2)
7. ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න. (ල. 3)
8. මහින්දාගමනයෙන් ලක්වැසියා ලත් දායාද 3 ක් නම් කරන්න. (ල. 3)
9 කාව්‍යශේඛරය රචනා කළ කතුවරයා කවුරුන්ද? (ල. 2)

02) 1) සත්සතිය ගතකළ ස්ථාන අතරින් 02 ක් නම් කරන්න.
2) පස්වන සතියේ සිදුවූ වැදගත් සිද්ධීන් පැහැදිලි කරන්න.
3) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය පිළිබඳ විස්තරයක් කරන්න. ( ල. 2 + 3 + 5 = 10 )

03) 1) හෙළ බොදු සිරිත් 02 ක් නම් කරන්න.
2) ඉන් එකක් පැහැදිලි කරන්න.
3) බොදු සිරිත් පිළිපැදීම තුළින් පාසල් සිසුන් වන ඔබ හට සැලසෙන යහපත විස්තර කරන්න.
( ල. 2 + 3 + 5 = 10 )

04) 1) අක්කොච්ඡි මං අවධිමං ............................ යන ගාථාව සම්පූර්ණ කරන්න.
2) එහි තේරුම ලියන්න.
3) ඉවසීමෙන් හා මෛත්‍රියෙන් කටයුතු කිරීම තුළින් පාසල් සිසුන් වන ඔබහට සැලසෙන යහපත පිළිබඳ විස්තර කරන්න. ( ල. 2 + 3 + 5 = 10 )

05) 1) චතුරාර්ය සත්‍යය නම් කරන්න.
2) තණ්හාවේ ප්‍රභේද 03 පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
3) ඔබ කැමති ආර්ය සත්‍යයක් පිළිබඳව විස්තරයක් කරන්න. ( ල. 2 + 3 + 5 = 10 )

06) 1) දොළොස් පින් කිරියවත් වලින් 4 ක් නම් කරන්න.
2) බත් පැන් වත් යහන ............ යන කවිය සම්පූර්ණ කරන්න.
3) දන්දීම යනු දස වැදෑරුම් වස්තු පූජා කිරීමයි. ඒ පිළිබඳ කෙටි සටහනක් ලියන්න. ( ල. 2 + 3 + 5 = 10 )

07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1) විශාඛා මහා උපාසිකාව.
2) ආජීවක අෂ්ටමක ශීලය.
3) මහින්දාගමනයෙන් අප ලත් දායාද.
4) බෝසතාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය. ( ල. 5+ 5 = 10 )

# තෙවන වාර පරීක්ෂණය - 2019

## බුද්ධ ධර්මය

07 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### බුද්ධ ධර්මය I

| | | | |
|---|---|---|---|
| 01) | III | 11) | කරණීයමෙත්ත සූත්‍රය |
| 02) | II | 12) | සීත වනයේ |
| 03) | I | 13) | පටිසෝතගාමී |
| 04) | III | 14) | පංචශීලය |
| 05) | I | 15) | යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම |
| 06) | ✓ | 16) | අපණ්ණක ජාතකය |
| 07) | X | 17) | වෘද්ධාපචායනය |
| 08) | ✓ | 18) | රොබට් නොක්ස් |
| 09) | X | 19) | මංගල කරුණකි |
| 10) | ✓ | 20) | ධම්ම නියාමය |

### බුද්ධ ධර්මය II

01)
1. ඔවුහු කලක් රටේ අභිවෘද්ධිය සඳහා තම කාලය, ධනය හා ශ්‍රමය කැපකිරීම, ආරක්ෂාව, රැකවරණය හා දැනමුතුකම් ලබාදීම.
2. වාරියපොළ සුමංගල හිමි, කුඩාපොළ හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි........
3. උතු නියාම, බීජ නියාම, ධම්ම නියාම, කම්ම නියාම, චිත්ත නියාම.
4. 114 පිටුව ( පෙළ පොත 7 ශ්‍රේණිය).
5. අත්තාධිපති, ලෝකාධිපති, ධම්මාධිපති.
6. 133 පිටුව ( පෙළ පොත 7 ශ්‍රේණිය).
7. ශාරීරික , පාරිභෝගික, උද්දේසික.
8. 142 පිටුව ( පෙළ පොත 7 ශ්‍රේණිය).

9 තොටගමුවේ ශ්‍රී රාහුල හිමි.

02)
01 } 02 පිටුව 7 ශ්‍රේණිය පෙළ පොත
02 }
03 06 පිටුව ( පෙළ පොත 7 ශ්‍රේණිය).

03)
1. වැඩිහිටියන්ට සැලකීම , කළගුණ සැලකීම , ආගන්තුක සත්කාරය , අග්‍රශෂ්‍ය දානය , භික්ෂු නායකත්වය පිළිගැනීම.
2. 13 පාඩම (පෙළ පොත 7 ශ්‍රේණිය).
3. සුදුසු පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

04)
1. 53 හා 54 පිටුව
2. එම
3. 7 පාඩම, 54 පිටුව ( සමස්ථයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න).

05
1. දුක්ඛ ආර්ය සත්‍යය
   දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
   දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
   දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය
2. කාම තණ්හා , භව තණ්හා හා විභව තණ්හා පිළිබඳ කෙටි විස්තරයක්.
3. 117, 118, 119, 120, 121, 122, 123, පිටු ( පෙළ පොත 7 ශ්‍රේණිය).

06)
1. 153 පිටුව ( පෙළ පොත 7 ශ්‍රේණිය).
2. බත් පැන් වත් — යහන
   මල් සුවඳ සහ — විලවුන
   පහනට තෙල් — විමන
   මෙලෙස දන්වත් සමග — වාහන
3. 21 පාඩම , 153 පිටුව (7 ශ්‍රේණිය පෙළපොත)

07) මාතෘකා 02 කට සුදුසු ආකාරයෙන් කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.